සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය- 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## ගණිතය - I

කාලය පැය 02 යි

නම / විභාග අංකය: ..............................................................................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01. දී ඇති රූප සටහන් වලින් වෘත්තාකාර හැඩ තෝරා යටින් ඉරක් අඳින්න.





02. තිරස් බව දැනගැනීමට භාවිතාකරන උපකරණය ........................................................ ද,

සිරස් පිහිටීම හඳුනාගැනීමට භාවිතාකරන උපකරණය ........................................................... ද වේ.

03. $3^2 = 2^3$ මෙය සත්‍යද අසත්‍ය ද? හේතු දක්වන්න.

04. සුළු කරන්න. $\frac{7}{12} + \frac{1}{3}$

05. ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාව ලියන්න.




06. **1997 මාර්තු 5** වන දිනය අන්තර් ජාතික සම්මත ආකාරයෙන් ලියන්න.

07. 3245 සංඛ්‍යාවේ, 2න් නිරූපණය වන අගය 4න් නිරූපණය වන අගය මෙන් කී ගුණයක් වේද?

08. පහත ප්‍රකාශන සත්‍ය නම් ( ✓ ) ලකුණ ද අසත්‍ය නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

- සනකාභයක සමචතුරස්‍රාකාර මුහුණත් ද තිබිය හැක ( )
- චතුස්තලයක ශීර්ෂ ගණන හා මුහුණත් ගණන සමාන වේ. ( )
- සනකයක ශීර්ෂ ගණන හා මුහුණත් ගණන එකතු කළවිට එහි දාර ගණනට සමාන වේ. ( )

---

09. A, B, හා C නම් පෙට්ටි තුනක් තරාදියක් මත තබා ඇති අවස්ථා දෙකක් පහත රූපවල දැක්වේ. එමගින් (C) පෙට්ටියේ ස්කන්ධය සොයන්න.




.............................................

---

10. පංතියක සිසුන් 8 දෙනෙකු අතර බෙදීමට පොත් 92ක් ඇත. සියලු දෙනාටම සමාන පොත් ගණනක් ලැබීමට නම් තවත් පොත් කීයක් අවශ්‍ය වේද?

---

11. පහත කාණ්ඩ හැඳින්වීම සඳහා පොදු වූ ලක්ෂණ අනුව සුදුසු නම ලියන්න.

ගෝවා, දඹල, බෝංචි, වට්ටක්කා

මීටර, සෙන්ටි මීටර, කිලෝමීටර, මිලිමීටර

............................................. .............................................

---

12. පස්වන ත්‍රිකෝණ සංඛ්‍යාව **තිත් සටහනකින්** දක්වන්න. එහි අගය ලියන්න.

---

13. භාජනයක අඩංගු බීම ප්‍රමාණය $2l\ 300ml$ වේ. එය මිලිලීටර වලින් දක්වන්න.

---


14. 6 වන සමචතුරස්‍ර සංඛ්‍යාව සහ 8 වන ත්‍රිකෝණ සංඛ්‍යාව සමාන බව රවිඳු පවසයි. මෙය නිවැරදි වේද? නොවේද? යන්න පැහැදිලි කරන්න.

---

15. 32 සංඛ්‍යාව, 2හි බලයක් ලෙස ලියා දක්වන්න.

16. මහා කෝණයට වඩා විශාලත්වයෙන් වැඩි කෝණ වර්ග දෙකක් ලියන්න.

17. චතුස්තලයක් සකස්කර ගත හැකි පතරමක කොටසක් පහත දැක්වේ. එම පතරම සම්පූර්ණ කරන්න.



18. පහත දී ඇති දශම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

**2.21 , 1.2 , 2.12 , 2.2**

19. අගය සොයන්න.

26 x 100 = .....................................

2400 ÷ 10 = .....................................

20. අංජලී ප.ව. 3.30 සිට ප.ව. 5.00 දක්වා රූපවාහිනිය නරඹයි. ඇය ප.ව. 5.45 සිට ප.ව. 7.30 දක්වා පාඩම් වැඩවල නිරත වෙයි. ඇය වැඩි වේලාවක් වැයකරන්නේ ඉහත කවර කාර්යයක් සඳහාද?

# ගණිතය

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 5කි.**

01. මිහිඳු මහා විද්‍යාලයේ ගණිතය විෂය භාර ගුරුභවතා විසින් 06 ශ්‍රේණියේ සිසුන් සඳහා පහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදෙන ලදී.
06 ශ්‍රේණියට ආසන්න වසර 5ක අලුතින් ඇතුළත්වන සිසුන් පිළිබඳ "තොරතුරු සොයමු, ප්‍රස්තාර ගත කරමු" ව්‍යාපෘතිය යටතේ රැස්කල තොරතුරු දැක්වෙන අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රගණන ලකුණු | සංඛ්‍යාව |
|---|---|---|
| 2019 | 𝍸 𝍸 // | 12 |
| 2020 | 𝍸 𝍸 //// | ............... |
| 2021 | .................................... | 17 |
| 2022 | 𝍸 𝍸 𝍸 𝍸 | ............... |
| 2023 | .................................... | 23 |

i. වගුව නිවැරදිව සම්පූර්ණ කරන්න.

ii. 2019 වර්ෂයට ඇතුළත් වූ මුළු සිසුන් නිරූපණය සඳහා ⊜⊜⊜ ලෙස චිත්‍ර ප්‍රස්තාරයට යොදා ගැනීමට මෙම සිසුන් අදහස් කරයි. ඒ අනුව ⊜ මගින් කොපමණ සිසුන් ගණනක් නිරූපණය වේද?

..............................................................................................................................................

iii. ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයේ දැක්වීම සඳහා පහත වගුව සම්පූර්ණ කරන්න.

| වර්ෂය | සිසුන් ගණන |
|---|---|
| 2019 | ⊜ ⊜ ⊜ |
| 2020 | |
| 2021 | |
| 2022 | |
| 2023 | |


iv. මිහිඳු විද්‍යාලයට අලුතින් සිසුන් ඇතුළත් වීමේ වර්ධනය පිළිබඳව ඔබේ අදහස් ලියන්න.

..............................................................................................................................................

v. ඉහත වගුවට අනුව එක්තරා වර්ෂ 3ක අලුතින් ඇතුළත් වූ මුළු ගණන හා වෙනත් වර්ෂ දෙකකදී ඇතුළත් වූ මුළු සිසුන් ගණනට සමාන වේ. එසේ ඉහත ප්‍රකාශය සත්‍යවන වගුවේ සඳහන් වර්ෂ දෙක කුමක්ද?

..............................................................................................................................................

02. බෝතලයක ඇසුරුමක දවටනයක කොටසක් පහත වේ.




i. අනුපාත ලෙස ලිවිය හැකි ද්‍රව්‍ය (රාශි) යුගළ 2ක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

ii. a) ලේබලයේ සඳහන් ස්කන්ධය දක්වා ඇති ද්‍රව්‍ය (රාශි) අතර අනුපාතය ලියන්න.

..........................................................................................................

b) එම අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

..........................................................................................................

iii. සරලම අනුපාතය ලෙස **2:3** ලැබෙන ද්‍රව්‍ය (රාශි) 2ක් ලේබලයේ ඇත. එම ද්‍රව්‍ය (රාශි) දෙක අනුපිළිවෙලින් ලියන්න.

..........................................................................................................

iv. ඉහත ලේබලයේ සඳහන් අනුපාතිකයක් ලෙස ගත හැකි ද්‍රව්‍ය (රාශි) 2ක් තොරා ලියන්න.


..........................................................................................................


v. අඹ යුෂ ලීටර් 1ක මිල රු. 720කි. ඉහත බීම බෝතලයක් සැකසීමට අවශ්‍ය අඹ යුෂ සඳහා වැයවන මුදල කොපමණද?

..........................................................................................................

---

03. 06 ශ්‍රේණිය පංති කාමරයේ ගුරු මේසය මේස රෙද්ද 1cm x 1cm වන කොටු ජාලකයක් ලෙස සකසා අතුරා ඇත. ඒ තුළ පන්ති වාර්තා පොත (A), නාම ලේඛනය (B), හුණු කුරු හා හුණු කොට්ට තබන භාජනය (C), මල්පෝච්චිය (D) යන දෑ තැබීමට ඉඩ වෙන්කර ඇත.




ඉගියඃ  මගින් 100 $cm^2$ නිරූපණය වේ.

i. වැඩි වර්ගඵලයක් ලබාගෙන ඇති දෙය කුමක්ද? ..............................

ii. අඩු වර්ගඵලයක් ලබාගෙන ඇති දෙය කුමක්ද? ..............................

iii. පහත වගුව සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | වර්ගඵලය ($cm^2$) |
|---|---|
| A | |
| B | |
| C | |
| D | |

iv. ඉහත ද්‍රව්‍ය සියල්ලම මේසය මත තැබූ විට මේස රෙද්දේ ඉතිරිවන වර්ගඵලය කොපමණදැයි සොයන්න.

..............................

..............................

---

04. i. දී ඇති සංකේත අතරින් වීජීය සංකේත ලෙස ගතහැකි ඒවා තෝරා ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | b | g | D | e | I |

ii. පහත වගන්ති අතුරින් වීජීය සංකේත මගින් ප්‍රකාශ කළ හැකි ඒවා තෝරා යටින් ඉරක් අඳින්න.

දිනකට ඇති පැය ගණන

දිනකට පුද්ගලයකු අවදිව සිටින පැය ගණය

වනාන්තරයක සිටින සතුන් ගණන

20 ට අඩු ප්‍රථමක සංඛ්‍යා ගණන

iii. දෙහි ගසක දෙහි y සංඛ්‍යාවක් ඇත. පැයකට පසු දෙහි ගෙඩි 3ක් බිම වැටී තිබුණි. දැන් දෙහි ගසේ ඇති මුළු ගෙඩි ප්‍රමානය වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

..............................

iv. කම්කරුවෙකු දින 03ක දී කපන ලද කාණුවක දිග ප්‍රමාණ පහත රූප සටහනේ දැක්වේ.



මීටර 20 මීටර t මීටර 10

a. මෙම කාණුවේ මුළු දිග දැක්වෙන වීජීය ප්‍රකාශනය ලියන්න.

..............................

b. කාණුවේ මුළු දිග මීටර 45ක් නම් t මගින් දැක්වෙන දිග කොපමණද?

..............................


v. ක්‍රීඩාවක් සඳහා සපයාගත් කාඩ්පත් 05ක් පහත දැක්වේ.

| P | Q | R | S | T |
|---|---|---|---|---|
| a = 3 | b = 1 | c = 2 | d = 4 | e = 0 |
| a + 5 | b + 9 | 10 - c | 11 - d | 8 + e |

අදාල කාඩ්පතෙහි වීජීය ප්‍රකාශනයේ වටිනාකම ආදේශයෙන් සොයා සමාන වටිනාකම් ලැබෙන කාඩ්පත් තෝරා ලියන්න.

..............................

05. විශාල සමචතුරස්‍ර කාඩ්බෝඩ් කැබැල්ලක් භාවිතාකර ක්‍රියාකාරකමක් සඳහා දක්වා ඇති කඩ ඉරි දිගේ කපා ගනිමින් සරල රේඛීය තල රූප කීපයක් වෙන්කර ගනී.



i. ඔහු විසින් කපා වෙන්කරගන්නා ලද තල රූප ගණන කීයද? ..............................................................................


ii. වෙන්කරගත් චතුරස්‍ර වර්ග නම් කරන්න.

..............................................................................

..............................................................................

..............................................................................

iii. කපාගන්නා ලද පෙන්වා ඇති හැඩතලය, ඉහත රූපයේ දැක්වෙන හැඩතල දෙකකට වෙන්කර ගත හැක. එසේ වෙන් කිරීමට මෙම හැඩතලය කපා ගත යුතු රේඛාව කඩ ඉරකින් දක්වන්න.



iv. a) මුල් රූපයෙන් කපාගත් හැඩතල දෙකක් භාවිතයෙන් ඍජුකෝණාස්‍රයක් සකස්කරගත හැක. එසේ සකස් කිරීමට අවශ්‍ය හැඩතල දෙක නම් කරන්න.


..............................................................................

b) එම කොටස් එකතුවීමෙන් ලැබෙන ඍජුකෝණාස්‍රය ඇඳ දක්වන්න. සම්බන්ධවන සරල රේඛා කඩ ඉරකින් දක්වන්න

---

06. දෙවන වාර පරීක්ෂණයේ ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණු සංඛ්‍යා රේඛාවක් යොදා ගනිමින් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට තීරණය කර තිබුණි.

i. දී ඇති සංඛ්‍යා රේඛාව මත, පහත තොරතුරු සලකුණු කරන්න.
නිලීෂ ලබාගත් ලකුණු ගණන 74 කි.
වත්සානගේ ලකුණු නිලීෂගේ ලකුණට වඩා 6කින් වැඩිය
රොෂේන්ගේ ලකුණු නිලීෂගේ ලකුණට වඩා 8ක් අඩුය.




ii. සිසුන් තිදෙනාගේ නම් භාවිතා කර, අසමානතා ලකුණු (<, >) යොදා ගනිමින් සැසඳීම් 3ක් ලියන්න.

..............................................................................

..............................................................................

..............................................................................

iii. නිලීෂගේ ලකුණ ආසන්න 10 ට වටයා ලියන්න.

..............................................................................

iv. රවිඳුගේ ලකුණ ආසන්න 10ට වැටයූ විට අගය 90කි. රවිඳු ලබා තිබිය හැකි අඩුම ලකුණ කීයද?

..............................................................................

07. a)

| | | | | |
|---|---|---|---|---|
| 189 | 70 | 145 | 79 | 36 |
| 65 | 103 | 88 | 105 | 97 |
| 93 | 230 | 61 | 124 | 110 |

i. ඉහත කොටු ජාලකය තුළ ඇති **පහෙන් ඉතිරි** නැතිව බෙදෙන සංඛ්‍යා සියල්ලම තෝරා ලියන්න.

.......................................................................................................................................

ii. **දෙකේ ගුණාකාර** වන සංඛ්‍යා හතරක් ලියන්න.

.......................................................................................................................................

iii. **2 සහ 5** යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාර වන සංඛ්‍යා සියල්ලම ලියන්න.

.......................................................................................................................................

b) කාඩ්පත් දෙකක සඳහන් කර ඇති ඉලක්කම් පහත පරිදි වේ.

| ලවය සඳහා ගත හැකි ඉලක්කම් | හරය සඳහා ගතහැකි ඉලක්කම් |
|---|---|
| 3 5 1 4 7 | 2 9 8 6 |

මෙම ඉලක්කම් පමණක් භාවිතා කර

i. නියම භාග දෙකක් ලියන්න

.......................................................................................................................................

.......................................................................................................................................

ii. $\frac{1}{2}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය- 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023





## ගණිතය

**පිළිතුරු පත්‍රය**

### I කොටස

| | | | |
|---|---|---|---|
| 1. | (i), (iii) | 1<br>1 | 2 |
| 2. | ලෙවලය<br>ලම්බය | 1<br>1 | 2 |
| 3. | $3^2 = 3 \times 3 = 9$<br>$2^3 = 2 \times 2 \times 2 = 8$<br>$9 > 8$ }<br>අසත්‍ය වේ. } | <br>1<br>1 | 2 |
| 4. | $\frac{7}{12} + \frac{1}{3}$<br>$= \frac{7 + 4}{12}$<br>$= \frac{11}{12}$ | <br>1<br>1 | 2 |
| 5. | 20.31 | | 2 |
| 6. | 1997- 03 - 05 | | 2 |
| 7. | 5 ගුණය<br>200 / 40 | <br>1 | 2 |
| 8. | ✓ }<br>✓ }<br>× | 1<br>1 | 2 |
| 9. | 440 g<br>2kg 75g<br>1kg 635g | <br><br>1 | 2 |
| 10. | පොත් 4 | | 2 |
| 11. | ළලවළ<br>දිග මනින ඒකක | 1<br>1 | 2 |
| 12. | <br>15 | 1<br>1 | 2 |
| 13. | 2030 | | 2 |
| 14. | සමාන වේ<br>6 x 6 = 36<br>1 + 2 + 3 + 4 + 5 + 6 + 7 + 8 = 36 | <br><br>1 | 2 |
| 15. | $2^5$<br>2 \| 32<br>2 \| 16<br>2 \| 8<br>2 \| 4<br>2 \| 2<br>1 | 1 | 2 |
| 16. | සරල කෝණ<br>පරාවර්ත කෝණ | 1<br>1 | 2 |
| 17. |  | | 2 |
| 18. | 1.2, 2.12, 2.2, 2.21 | | 2 |
| 19. | 2600<br>240 | 1<br>1 | 2 |
| 20. | පාඩම් වැඩ සඳහා | | 2 |

# II කොටස

| ප්‍රශ්නය | පිළිතුර | ලකුණු | මුළු |
|---|---|---|---|
| 1. I. | වර්ෂය / ප්‍රගණන ලකුණු / සංඛ්‍යාව: 2019 — 卌 卌 \|\| — 12; 2020 — 卌 卌 \|\|\|\| — 14; 2021 — 卌 卌 卌 \|\| — 17; 2022 — 卌 卌 卌 卌 — 20; 2023 — 卌 卌 卌 卌 \|\|\| — 23 | 1, 1, 1, 1 | |
| II. | 4 | 2 | |
| III. | වර්ෂය / සිසුන් ගණන: 2019, 2020, 2021, 2022, 2023  | 1, 2, 1, 2 | |
| IV. | වර්ධනය වේ හෝ සමාන අදහසට | 2 | |
| V. | 2022, 2023 | 2 | 16 |
| 2. I. | සීනි, ලුණු හෝ සුදුසු රාශි දෙකක් | 1 | |
| | අඹ යුෂ, වර්ණක, ජලය | 1 | |
| II. | a. සීනි, ලුණු<br>75 : 5 | 1 | |
| | b. 15 : 1<br>මාරු වී ලියා තිබුණද ලකුණු දෙන්න | 1 | |
| III. | අඹ යුෂ, ජලය | 3 | |
| IV. | නිවැරදි පිළිතුරකට | 2 | |
| V. | 1m $\frac{720}{1000}$ x 100 හෝ නිවැරදි ක්‍රමයකට | 1 | |
| | රු. 72 | 1 | 11 |
| 3. I. | නාමලේඛනය හෝ B | 1 | |
| II. | මල්පෝච්චිය හෝ D | 1 | |
| III. | ද්‍රව්‍යය / වර්ගඵලය ($cm^3$): A — 600; B — 1200; C — 150; D — 100 | 2, 2, 1, 1 | |
| IV. | 7500<br>− 2050<br>5450 | 1, 1, 1 | 11 |
| 4. I. | b, g, e<br>(තුනම තිබිය යුතුය) | 1 | |
| II. | දිනකට පුද්ගලයෙකු අවදිව සිටින පැය ගණන | 1 | |
| | වනාන්තරයක සිටින සතුන් ගණන | 1 | |
| III. | y - 3 | 1 | |
| IV. | 20 + t + 10 | 1 | |
| | 30 + t / t + 30 | 1 | |
| | b. 30 + 15<br>15 | 1 | |
| V. | a + 5 = 8<br>b + 9 = 10<br>10 - c = 8<br>11 - d = 7<br>8 + e = 8 | 2 | |
| | P, R හා T | 2 | 11 |
| 5. I. | 4 | | 2 |
| II. | සමචතුරස්‍රය,<br>ත්‍රපීසියම,<br>සමාන්තරාස්‍රය | 1, 1, 1 | 3 |
| III. |  | | |
| IV. | ත්‍රපීසියම, ත්‍රිකෝණය | | 2 |
| | b.  | 1 | 2<br>2<br>11 |
| 6. I. |  | 2<br>2<br>2 | 6 |
| II. | රොෂේන් < නිලීෂ<br>රොෂේන් < වත්සාන<br>නිලීෂ < වත්සාන | 1<br>1<br>1 | 3 |
| III. | 70 | 1 | |
| IV. | 85 | 1 | 11 |
| 7. a. | i. 70, 145, 65, 230, 110 | 1, 1, 1 | 3 |
| | ii. නිවැරදි පිළිතුරු 4 ට | 1, 1 | 2 |
| | iii. 70, 230, 110 | | 2 |
| b. | i. නිවැරදි පිළිතුරකට | | 2 |
| | ii. 3/6, 4/8 | | 2<br>11 |